# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2158/3 - 2020 ජනවාරි මස 13 වැනි සඳුදා - 2020.01.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) වැනි ව්‍යවස්ථාව යටතේ පත්කරන ලද තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාට වහාම ක්‍රියාත්මකවන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් විෂයයන් සහ කාර්යයන් පැවරීම පරිදි සිදුකරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**රමේෂ් පතිරණ,**
වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍ය.

2020 ජනවාරි මස 09 වැනි දින.

**උපලේඛනය**

**ගරු කංචන විජේසේකර, තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. තේ වගා කටයුතු සඳහා ගුණාත්මකභාවයෙන් යුතු පැල ලබා දීම මගින් ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල හා අනෙකුත් පහසුකම් සැපයීම. | 1. ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>2. තේ පර්යේෂණ ආයතනය<br>3. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 1. ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය (1975 අංක 14)<br>2. තේ පාලන පනත (1957 අංක 51)<br>3. තේ ශක්ති අරමුදල් පනත ( 2000 අංක 47) |
| 2. තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායීතාවය සඳහා අන්තර් ජාතික තරගකාරිත්වය ඉහළ නැංවීම | 4. තේ ශක්ති අරමුදල | |

1A - G 31793 — 417 (2020/01)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**ගරු කංචන විජේසේකර, තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
|---|---|---|
| 3. තේ අපනයනය සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | 5. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව | 4. කුඩා තේ වතු සංවර්ධන පනත (1975 අංක 35) |
| 4. තේ කර්මාන්ත සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු | | 5. තේ සහනාධාර පනත ( 1958 අංක 12) |
| | | 6. තේ (බදු හා අපනයන පාලන) පනත (1959 අංක 16) |
| | | 7. තේ පර්යේෂණ මණ්ඩල පනත (1993 අංක 52) |

---

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) වැනි ව්‍යවස්ථාව යටතේ පත්කරන ලද අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයාට වහාම ක්‍රියාත්මකවන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් විෂයයන් සහ කාර්යයන් පැවරීම පරිදි සිදුකරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**රමේෂ් පතිරණ,**
වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍ය.

2020 ජනවාරි මස 09 වැනි දින.

**උපලේඛනය**

**ගරු ජානක වක්කුඹුර, අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. දේශීය නිෂ්පාදනවල අගය එකතු කිරීම, ඉහළ වටිනාකමකින් යුතු භාණ්ඩ නිෂ්පාදනය කිරීම, අපනයන වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම හා කර්මාන්ත සුරක්ෂිතභාවය ඇති කරමින් ගොවීන් සහ කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන් ගෝලීය ආර්ථිකය වෙත යොමු කිරීම සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ක්‍රියාත්මක කිරීම. | 1. ශ්‍රී ලංකා කජු සංස්ථාව | 1. උක් පර්යේෂණ ආයතන පනත (1981 අංක 75) |
| | 2. සී/ස හිඟුරාන සීනි කර්මාන්ත සමාගම | 2. අපනයන කෘෂි සංවර්ධන පනත (1992 අංක 46) |
| | 3. සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම | |
| | 4. කන්තලේ සීනි සමාගම | |
| | 5. උක් පර්යේෂණ ආයතනය | |
| | 6. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**ගරු ජානක වක්කුඹුර, අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 2. අගය එකතු කළ නිෂ්පාදන ද ඇතුළුව තිරසර සම්පත් භාවිතය සහ ජෛව ආරක්ෂණය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. | 7. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය | |
| 3. කෘෂිකාර්මික සංවර්ධන කලාප සම්බන්ධ කටයුතු. | | |
| 4. ප්‍රති අපනයනය වෙනුවට කුරුඳු, ගම්මිරිස් වැනි දේශීය බෝග වර්ග ශ්‍රී ලංකා සන්නාම නාම ලෙස අපනයන වෙළඳ පොළ සඳහා දියුණු කිරීම. | | |

01-649

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.